**සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**"අභ්‍යාසලාභී උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන" යටතේ බඳවා ගත් උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරීන් සබරගමුව පළාතේ පළාත් සභාවට අයත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2022.**

සබරගමුව පළාතේ පළාත් සභාවට අයත් සිංහල හා දෙමළ මාධ්‍ය පාසල්වල, උප ලේඛන අංක I යටතේ දක්වා ඇති විෂය ක්ෂේත්‍රයන්ට අදාලව පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අංක 21/0658/340/013 හා 2021.04.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය, අංක 21/2076/315/033-I හා 2021.12.13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/02/29/21/AI/01/2020 හා 2021.12.31 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව, මෙම නිවේදනයේ අංක 1 යටතේ දක්වා ඇති කාණ්ඩ වලට අයත්, උපාධිධාරීන්ගෙන් හා ඩිප්ලෝමාධාරීන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1). අයදුම්කල හැකි කාණ්ඩයන් :-**

1:1. **"උපාධිධාරීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020"** යටතේ බඳවා ගනු ලැබූ සියලුම උපාධිධාරී අභ්‍යාසලාභීන්.

1:2. 2018 සහ 2019 වර්ෂයන්හිදී ක්‍රියාත්මක කළ **"අභ්‍යාසලාභී උපාධිධාරීන් හට රජයේ ආයතනවල පුහුණුවක් ලබාදීම"** වැඩසටහන යටතේ උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස පුහුණුවට බඳවාගනු ලැබ 2020.01.01 සහ 2021.01.01 දින සිට සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීම් ලැබූ කණ්ඩායම.

1:3. ඩිප්ලෝමාධාරීන් බඳවා ගනු ලබන විෂයයන් සඳහා ඉහත 2020, 2019 හා 2018 කණ්ඩායම්වලට අයත් ඩිප්ලෝමාධාරීන්.

**2). සාමාන්‍ය සුදුසුකම් :-**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
iii. 2019.12.31 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබිය යුතු අතර, එදිනට වයස අවුරුදු 35 නොඉක්මවිය යුතුය.
iv. මෙම නිවේදනයේ සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

**3). අධ්‍යාපන සුදුසුකම් :-**

i. අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ සටහන 6 වගන්තිය ප්‍රකාරව අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවකුම අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබිය යුතුය.
ii. ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂ කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් (දේශීය/විදේශීය) විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමෙන ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපාධියක්/ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතු අතර, එම උපාධියට/ඩිප්ලෝමාවට හදාරා ඇති ප්‍රධාන විෂයයන් වලට අනුකූලව එක් එක් විෂය සඳහා උප ලේඛන අංක I හි සඳහන් සුදුසුකම් සපුරා තිබීම අනිවාර්යය වේ.
**(සැලකිය යුතුයි :- විෂය කේත අංක 14,15 හා 36 යටතේ අයදුම් කරනු ලබන අයදුම්කරුවන් හැර අයදුම් කරනු ලබන සෙසු සෑම උපාධිධාරියෙකුම/ඩිප්ලෝමාධාරියෙකුම අංක 17/1597/742/027 හා 2017.08.29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඉගැන්වීමට නියමිත විෂය, උපාධියට හදාරනු ලැබූ මුළු විෂය සංධාරයෙන් තුනෙන් එකක් (1/3) සම්පූර්ණ කල අයවළුන් පමණක් විය යුතුය.)**

**4). බඳවා ගැනීමේ ක්‍රමය හා සේවා කොන්දේසි :-**

4:1. පවතින පාසල් පාදක ගුරු පුරප්පාඩු සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීමේදී එක් එක් අයදුම්කරුවාගේ අධ්‍යාපන සුදුසුකම් සළකා විෂයානුබද්ධව පවතින පුරප්පාඩු සඳහා පමණක් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

4:2. සබරගමුව පළාත් පාසල්වල පවතින, උප ලේඛන අංක I හි දක්වා ඇති පුරප්පාඩු විෂයයන් සඳහා පමණක් පාසල් පාදකව මෙම බඳවා ගැනීම් සිදුකරනු ලැබේ. ඊට අදාළ විෂයානුබද්ධ පුරප්පාඩු ලේඛනය සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට පෙර ප්‍රසිද්ධ කරනු ලබන හෝ සම්මුඛ පරීක්ෂණ අවස්ථාවට පෙර ප්‍රදර්ශනය කරනු ඇත. එකී පුරප්පාඩු ලේඛනය මත පමණක් පදනම්ව පත්වීම් ලබා දෙනු ලැබේ. විදුහල්පතිවරුන් විසින් අපේක්ෂකයන් වෙත පෞද්ගලිකව නිකුත් කරනු ලබන පුරප්පාඩු ලිපි ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4:3. එසේ ප්‍රසිද්ධ කරනු ලබන විෂයානුබද්ධ පුරප්පාඩු ලේඛනය අනුව, අයදුම්කරුවන් විසින් පුරප්පාඩු පවතින පාසල් සඳහා පත්වීම් ලබාගැනීමට ඇති ස්වකීය මනාපය අනුපිළිවෙලින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී දැක්විය යුතුය.

4:4. එක් එක් විෂය සඳහා පවතින පුරප්පාඩු සඳහා පත්වීම් ලබාදීමේදී ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු අනුපිළිවෙල අනුව පත්වීම් ලබා දෙනු ලැබේ.

4:5. පත්වීම් ලබාදීම, ස්ථානගත කිරීම සිදුකරනු ලබන්නේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව, ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු අනුපිළිවෙල හා පදිංචිය අනුව වන අතර, පාසල් සඳහා මනාප ලකුණු කිරීම පත්වීමක් ලබා ගැනීම සඳහා වන සුදුසුකමක් සේ සලකනු නොලැබේ.

4:6. මනාප ලකුණු කරනු ලැබූ පාසල් සඳහා පත්කිරීම හෝ මනාප ලකුණු නොකලද සබරගමුව පළාතේ දුෂ්කර හා අතිදුෂ්කර පාසල්වල පවතින ගුරු හිඟතාව මත, සේවා අවශ්‍යතාව සලකා පුරප්පාඩු ලේඛනයේ සඳහන් වෙනත් ඕනෑම පාසලක් වෙත අයදුම්කරුවෙකු පත්කිරීමේ අවසන් තීරණය සබරගමුව පළාත් අධ්‍යාපන ලේකම් සතුවේ.

4:7. පත්වීම් ලබාදීමේදී සබරගමුව පළාත තුල ස්ථිර පදිංචි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාව ලබාදෙන අතර, දැනට සංවර්ධන නිලධාරීන් ලෙස/අභ්‍යාසලාභී උපාධිධාරීන් ලෙස පාසල් වලට අනුයුක්තව පුහුණුව ලබන අයදුම්කරුවන්ගේ අනුයුක්ත පාසල හෝ එම පාසලේ කිසියම් විෂයක් ආවරණය කිරීම විශේෂ සුදුසුකමක් සේ සලකනු නොලැබේ.

4:8. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් එකක් හෝ කිහිපයක් හෝ සපුරා නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලා ඇති නමුත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතිකපත් සම්බන්ධව පසුව සලකා බලනු නොලැබේ.

4:9. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :- අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4.4.1(1) වගන්තිය ප්‍රකාරව ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීමට සහ කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. මේ යටතේ ලකුණු ලබාදීමක් සිදුකරනු නොලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ.

4:10. ප්‍රායෝගික පරීක්ෂණය :- අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4.4.1(2) වගන්තිය ප්‍රකාරව ගුරු වෘත්තියේදී වැදගත් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බැලීම සඳහා පවත්වනු ලැබේ. අයදුම්කරුවන් විසින් පත්වීම් ලබා ගැනීමට අපේක්ෂා කරන විෂයට අදාලව හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ විනාඩි 05කට නොඅඩු ඉදිරිපත් කිරීමක් ප්‍රායෝගික පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කල යුතුය. ප්‍රායෝගික පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක ඔස්සේ ලකුණු ලබාදෙනු ඇත.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | අරමුණ හා ප්‍රවිෂ්ට වීම. | 05 | 02 |
| 2. | පෞරුෂය හා හඬ පාලනය. | 05 | 02 |
| 3. | සන්නිවේදනයේ පැහැදිලි බව. | 05 | 02 |
| 4. | කාල කළමනාකරණය. | 05 | 02 |
| 5. | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය. | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය. | 25 | 10 |

4:11. මෙසේ ලබා දෙනු ලබන පත්වීම තාවකාලික පත්වීමක් වන අතර, පත්වීම් ලබන පාසලේ වසර හතක (07) සේවා කාලයකට යටත් වේ.

4:12. තාවකාලික පත්වීම් ලබාදී වසර තුනක් (03) ඇතුළත ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4.1. වගන්තිය ප්‍රකාරව ලිඛිත විභාගයක් පවත්වා ඉන් සමත්වන නිලධාරීන් සඳහා පමණක් නිත්‍ය පත්වීම් ලබා දෙනු ලැබේ.

4:13. ඉහත විභාගය අසමත් වන අයදුම්කරුවන් සඳහා වසරක් (01) තුළ නැවත විභාගයක් පැවැත්වීම හෝ ඔවුන් පෙරළා පෙර සිටි තනතුරට පත් කිරීම හෝ උපාධිධාරී අභ්‍යාසලාභීන් සංවර්ධන නිලධාරීන් ලෙස අනුයුක්ත කිරීම සිදු කරනු ලැබේ.

4:14. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි විධිවිධාන අනුව, පත්වීම් ලබාදීමේදී පවත්නා පුරප්පාඩු ප්‍රමාණයෙන් 3%ක් විශේෂ අවශ්‍යතා ඇති අය සඳහා වෙන් කරනු ලැබේ. පත්වීම් සඳහා තෝරාගනු ලබන අවස්ථාවේදී අදාල තනතුරේ සේවය කිරීමට තම විශේෂ අවශ්‍යතා තත්ත්වය බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ කල යුතුය. කෙසේ වෙතත් විශේෂ අවශ්‍යතා ඇති අපේක්ෂකයෙකු පත්වීම් ලබාගැනීම සඳහා සුදුසුකම් ලැබීමට නම් ප්‍රායෝගික පරීක්ෂණයෙන් නියමිත ලකුණු ප්‍රමාණයන් ලබා තිබිය යුතුවේ.

4.15. වැටුප් පරිමාණය :- මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ගුරු සේවයේ නිත්‍ය පත්වීමක් බවට පරිවර්තනය වන්නේ වසර 03ක් අවසානයේ පවත්වනු ලබන විභාගයෙන් සමත් වන අයවළුන් සඳහා පමණි. එතෙක් ගෙවනු ලබන වැටුප වන්නේ සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අදාළ වැටුප් පියවර වේ. (රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ මත වැටුප් පරිමාණ සංශෝධනය විය හැකිය).

**5). <u>වෙබ් අඩවිය පරිශීලනය කිරීමේ පොදු උපදෙස් :-</u>**

5.1. ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය (N.I.C. Number) ඔබගේ user name එක ලෙස භාවිතා කල යුතු අතර, ලියාපදිංචිය සම්පූර්ණ වීම සඳහා ඔබ විසින් මුරපදයක් (password) ලබා දෙමින් නැවත ප්‍රවේශ (login) විය යුතුය. ප්‍රවේශ (login) වූ පසුව මුරපදය (password) වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ.

5.2. ඔබගේ මුරපදය (password) සිහිතබා ගැනීම මගින් ඇතුළත් කරන ලද තොරතුරු සංශෝධනය කිරීමට හැකියාවක් ඇත.

5.3. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය දක්වා ඔබ විසින් ඇතුලත් කරන ලද තොරතුරු සංශෝධනය කිරීමට හැකියාව පවතී.

5.4. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසුව කරනු ලබන ඉල්ලීම් භාරගනු නොලැබේ.

5.5. මාර්ගගත අයදුම්පතේ පුද්ගලික තොරතුරු, අධ්‍යාපනික සුදුසුකම් හා උපලේඛන අංක I හි සුදුසුකම් මත අපේක්ෂිත විෂය තේරීම යන කොටස් ඔබ විසින් සම්පූර්ණ කළ යුතුය.

5.6. එක් අයදුම්කරුවෙකුට එක් වරක් පමණක් ලියාපදිංචි වීම සඳහා අවස්ථාව හිමිවේ.

5.7. යම්හෙයකින් ඔබ මෙම නිවේදනයේ 1,2 හා 3 වගන්තිහි සඳහන් සුදුසුකම් සපුරා නොමැත්තේ නම් ඔබට මෙම තොරතුරු පද්ධතියට ඇතුළත් වීමට නොහැකිය.

**6). <u>වෙබ් අඩවිය පරිශීලනය කිරීමේ තාක්ෂණික උපදෙස් :-</u>**

6.1. නිවැරදි ජාතික හැඳුනුම්පත් අංකය (N.I.C. Number) ඇතුලත් කිරීමෙන් පමණක් ඔබට වෙබ් අඩවියට ප්‍රවේශ වීමට අවස්ථාව හිමිවේ.

6.2. නිවැරදි ජාතික හැඳුනුම්පත් අංකය (N.I.C. Number) ඇතුලත් කිරීමෙන් පසු දත්ත පද්ධතියට පූරණය වීමට ප්‍රථම ඔබගේ මව් භාෂාව ඇතුලත් කරන්න. අනතුරුව **"continue"** බොත්තම click කරන්න.

6.3. ප්‍රවේශ වූ පසු ඔබ විසින් මුරපදයක් (password) ලබා දිය යුතුය. ඔබ විසින් ලබා දෙනු ලබන මුරපදය (password) ඔස්සේ ඔබට ඔබගේ තේරීම් ඇතුළත් කළ හැකිය.

6.4. පෙර ලබාදුන් මුරපදයම (password) නැවතත් ලබා දෙන්න.

6.5. මුරපදය (password) ලබා දීමට පෙර තොරතුරු කියවා අවබෝධ කර ගැනීමෙන් පසු පමණක් අදාළ ස්ථානයේ (✓) සලකුණ යොදන්න. ඉන්පසු **"ලියාපදිංචි වීම සඳහා ඉදිරියට යන්න"** බොත්තම click කරන්න.

6.6. තිරයේ **"නව මුරපදය ලබා දීම සාර්ථකයි"** යනුවෙන් දිස්වනු ඇත. ඉන්පසු **"ඉදිරියට යන්න"** බොත්තම click කිරීමෙන් පසුව ඔබ නැවතත් මුල් පිටුව වෙත යොමු වනු ඇත. පෙර පරිදිම ඔබ ලියාපදිංචි වූ හැඳුනුම්පත් අංකය (N.I.C. Number), භාෂා මාධ්‍යය ලබා දීමෙන් පසු නැවත **"continue"** බොත්තම click කරන්න.

6.7. ඔබ ලියාපදිංචි වූ මුරපදය (password) යොදා නැවත වාරයක් ප්‍රවේශ **"(login)"** වන්න.

6.8. පසුව ඔබගේ පුද්ගලික තොරතුරු, අධ්‍යාපනික තොරතුරු හා උපලේඛන අංක I හි සුදුසුකම් මත අපේක්ෂිත විෂය තේරීමේ තොරතුරු ඇතුළත් කළ යුතුය.

6.9. ඔබ ඇතුලත් කල තොරතුරු ඇතුලත් සාරාංශය පරීක්ෂා කර, ගැටළුවක් පවතී නම් උපකාර දුරකතන අංක **(Help Desk)** මෙනුවෙහි ඇති අපගේ දුරකථන අංකයන් අමතන්න.

6.10. ඔබගේ තේරීම නැවත සංශෝධනය කිරීමට අවශ්‍ය නම් ඔබට මෙහිදී නැවත පුද්ගලික තොරතුරු, අධ්‍යාපනික තොරතුරු හා උපලේඛන අංක I හි සුදුසුකම් මත අපේක්ෂිත විෂය තේරීමේ තොරතුරු සංශෝධනය කළ හැකිය.

6.11. ඔබගේ තොරතුරු ඇතුලත් කිරීමෙන් අනතුරුව **"Download"** Iconය Click කර PDF ගොනුවක් ලෙස බාගත කර ගන්න. එලෙස බාගත කරගත් PDF ගොනුව මුද්‍රණය කර, නිසි ලෙස දත්ත සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ ආයතන ප්‍රධානියා ලවා සහතික කරවාගෙන එහි පරිලෝකනය (Scan) කරන ලද ඡායා පිටපතක් qgraduate.sg@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2022.04.29) හෝ ඊට පෙර යොමු කරන්න. (ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් වළකින්න).

6.12. අයදුම්පත්‍රයෙහි පරිලෝකිත (Scan) පිටපත විද්‍යුත් තැපැල මගින් එවීමේදී පණිවිඩයෙහි Subject යන තීරුවෙහි ඔබගේ නම මුල් අකුරු සමග ඉංග්‍රීසි මාධ්‍යයෙන් සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.

උදා :- Subject | A.B. PERERA – 833259065V |

6.13. එම අයදුම්පතෙහි පරිලෝකිත (Scan) මුල් පිටපත ඔබ සතුව තබා ගැනීම ඔබට පසුවට වැදගත් වනු ඇත. එකී මුල් පිටපත ඔබ සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන දිනයන්හිදී අනිවාර්යයෙන් රැගෙන ආ යුතුය.

6.14. යම් හෙයකින් ඔබ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනයට පෙර අයදුම්පත සංශෝධනය කලේ නම් අවසන් වරට සංශෝධිත අයදුම්පතෙහි පරිලෝකනය (Scan) කරන ලද පිටපත පමණක් ඉහත විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතුය.

6.15. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසුව කරන අයදුම්පත්‍රයේ අඩංගු තොරතුරු සංශෝධන කිරීම සඳහා වන ඉල්ලීම් භාරගනු නොලැබේ.

6.16. අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී පවතින කිසියම් ගැටළුවක් වේ නම්, ආයතන ප්‍රධානියා මගින් සහතික කරන ලද සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීම් ලිපියේ හෝ අභ්‍යාසලාභී පත්වීම් ලිපියේ පිටපතක්, ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් සහ ඔබ සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකයක් සඳහන් ඉල්ලීම් ලිපියක්ද සමග පරිලෝකනය (Scan) කර එම පිටපත් probgraduate.sg@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කිරීමට කාරුණික වන්න.

මෙම පරිලෝකිත (Scan) පිටපත් විද්‍යුත් තැපැල මගින් යොමුකිරීමේදී පණිවිඩයෙහි Subject යන තීරුවෙහි ඔබගේ නම මුල් අකුරු සමග ඉංග්‍රීසි මාධ්‍යයෙන් සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.

උදා :- Subject | A.B. PERERA – 833259065V |

**7). <u>පුරප්පාඩු තේරීම සඳහා උපදෙස් :-</u>**

7.1. එක් එක් විෂයට සහ මාධ්‍යයට අදාළව සබරගමුව පළාත් පාසල්හි පවතින ගුරු පුරප්පාඩු ලේඛනය පාසල් පාදකව හා විෂයානුබද්ධව සකස් කර, සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට පෙර ප්‍රසිද්ධ කරනු ලබන හෝ සම්මුඛ පරීක්ෂණ අවස්ථාවට පෙර ප්‍රදර්ශනය කරනු ඇත.

7.2. එම පුරප්පාඩු ලේඛනය අනුව උපලේඛන අංක I හි දක්වා ඇති සුදුසුකම් මත, අයදුම්කරනු ලබන විෂයට අදාලව ගුරු පුරප්පාඩු පවතින පාසල් 05 ක් පමණක් තෝරා සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ලබාදිය යුතුය.

**8). <u>උපකාරක දුරකථන අංක (Help Desk) :-</u>**

උපදෙස් සඳහා කාර්යාල දිනවල පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා පහත දුරකථන අංකය ඔස්සේ පමණක් විමසීම් කල හැකිය.

045-3466960

අතිවිශේෂ හේතුවක් මත නියමිත දිනට පෙර මෙම මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට අපොහොසත් වන අයවළුන් වහාම ඉහත උපකාරක දුරකථන අංකය **(Help Desk)** අමතා අවශ්‍ය උපදෙස් ලබා ගන්න.

**9).** අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2022.04.29 වේ. එදින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා පමණක් අයදුම් කිරීම සඳහා අවස්ථාව හිමිවනු ඇත.

**10).** කිසියම් අයදුම්කරුවෙකු සුදුසුකම් සපුරා නොමැති බව පත්වීම් ලැබීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අයදුම්පත කිසිදු හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද නියමිත සුදුසුකම් පිළිබඳව දැන දැනම හෝ ඕනෑකමින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු යටපත් කර ඇති බව හෝ පත්වීම් ලැබීමෙන් පසු අනාවරණය වුවහොත් හෝ පත්කිරීම සඳහා ඔබ නුසුදුසු බව හෝ අනාවරණය වුවහොත්, වහාම රජයේ සේවයෙන් පහ කරනු/සේවය අවසන් කරනු ලැබේ.

**11).** උපලේඛන අංක I හි සඳහන් පුරප්පාඩු විෂයයන් සඳහා පමණක් මෙම නිවේදනය මගින් අයදුම්පත් කැඳවා ඇති අතර, එබැවින් මෙම නිවේදනයට අදාලව අයදුම්පතක් ඉදිරිපත් කිරීම, පාසල් සඳහා මනාප ලකුණු කිරීම, සම්මුඛ පරීක්ෂණය සඳහා/ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවීම හෝ ඊට ඉදිරිපත් වීම හෝ දැනට සංවර්ධන නිලධාරියෙකු/අභ්‍යාසලාභී උපාධිධාරියෙකු ලෙස කිසියම් පාසලක් වෙත අනුයුක්තව පුහුණුව ලැබීම යන කිසිදු කරුණක් හෝ වෙනයම් ඕනෑම කරුණක් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ නිත්‍ය ගුරු පත්වීමක් ලබා ගැනීම සඳහා වන අයිතිවාසිකමක් හෝ නීත්‍යානුකූල හිමිකමක් නොවන්නේය.

**12).** මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද පුරප්පාඩුවලින් කොටසක් හෝ මුලුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ ඒ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය ද සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සතුය.

**13).** සබරගමුව පළාත් සභාවේ පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මෙතෙක් පැවති තරඟ විභාග සම්න්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/SG/0301/Vol III හා 2020.10.23 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව කටයුතු කරනු ලබන බව විශේෂයෙන් සැලකිය යුතුය.

**14).** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පල කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**සුජානි ආර්. විජේතුංග,**
ලේකම්,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත.

2022.03.29 වන දින,
සබරගමුව පළාත් සභාවේ,
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේදීය.

https://moe.sg.gov.lk/recruitment/index.php